VI

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ පළාත් සභාව

(බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය සහ නීතිය හා සාමය මුදල් හා ක්‍රම සම්පාදන, සෞඛ්‍ය, පළාත් පාලන සහ ඉඩම් අමාත්‍යාංශය)

## බස්නාහිර පළාතේ පළාත සභාවේ 1991 අංක 01 දරණ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

(බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සටහන් කළේ

1991 අප්‍රේල් මස 18 දින)

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන සෞඛ්‍ය, පළාත් පාලන, සහ ඉඩම් අමාත්‍යාංශයෙන් මිල දී ගත හැක.

මිල රු.	තැපැල් ගාස්තුව රු.

රු: 10/-

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ
# පළාත් සභාව

(බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය සහ නීතිය හා සාමය මුදල් හා ක්‍රම සම්පාදන, සෞඛ්‍ය, පළාත් පාලන සහ ඉඩම් අමාත්‍යාංශය)

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ
## 1991 අංක 01 දරණ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

මෙම ප්‍රඥප්තිය 1991 අප්‍රේල් මස 04 වන දින පවත්වන ලද බස්නාහිර පළාත් සභා රැස්වීමේ දී සභා සම්මත වූ බව සහතික කරමි.

**සභාපති**

**බස්නාහිර පළාත් සභාව**

## බස්නාහිර පළාතේ 1991 අංක 01 දරණ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

**පළාත් පාලන සේවයේ වර්තමාන සාමාජිකයන්, බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවයට පත් කිරීම සඳහාත්, බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයන් පළාත් පාලන ආයතනවල සේවයට පත් කිරීම හා ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බස්නාහිර පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.**

**මේ ප්‍රඥප්තිය, 1980 අංක 36 , 1985 අංක 10 සහ 1987 අංක 16 දරණ පණත් වලින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරණ පළාත් පාලන සේවා පනතට අනනුකූල වේ.**

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය " බස්නාහිර පළාත් සභාවේ 1991 අංක 01 දරණ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය" යනුවෙන හඳුන්වනු ලැබේ.

පළාත් පාලන සේවයේ සාමාජිකයන් පළාත් රාජ්‍ය සේවයට මුදාහැරීම

2. (1) (අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු, ඔහුගේ කැමැත්ත ඇතිව සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයකට, පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව හෝ එවැනිම කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකිය.

(ආ) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු ද, පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව පත්කරනු ලැබූ විට කලින් කල සංශෝධනය කරන ලද ජාතික රාජ්‍ය සභාවේ, 1974 අංත 16 දරණ පළාත් පාලන සේවා පණත් 20(අ) වන වගන්තියේ (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී සාමාජිකයින්ට අදාල විය යුතු ය.

(2) (අ) පළාත් පාලන සේවයේ සාමාජිකයකු සේවයට තාවකාලික පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී කලින් කල සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරණ පළාත් පාලන සේවා පණත් 20(අ) වන වගන්තියේ (4) උප වගන්තියේ විධි විධාන, අදාල වෙනස් කිරීම් සහිතව ඒ සාමාජිකයාට අදාල විය යුතුය.

(ආ) එවැනි සාමාජිකයෙක්, ඔහු පලාත් රාජ්‍ය සේවයට පත් කළ දින සිට පලාත් පාලන සේවය අත්හැර ගිය තැනැත්තෙකු ලෙස සලකනු ලැබිය යුතු අතර, පලාත් රාජ්‍ය සේවයෙන් ඉවත් වූ විටෙක දී ලබාගත හැකි, 1975 පලාත් පාලන විශ්‍රාම වැටුප් රෙගුලාසිවල සඳහන්, විශ්‍රාම වැටුප් ලබා ගැනීමට හිමිකම් තිබේ නම්, එම හිමිකම්වලට සහ මොන යම් හෝ වැන්දඹු හා අනත්දරු අරමුදලකින් එවැනි සාමාජිකයෙකුට හෝ එවැනි සාමාජිකයෙකුගේ යැපෙන්නෙකුට ලැබිය යුතු ප්‍රතිලාභයකට අවහිරයක් නොවන පරිදි, එහි සංශෝධනයන් සමග කියවිය යුතු, 1974 අංක 16 දරණ පලාත් පාලන සේවා පනතේ විධි විධානයන්, ඒ අනුව ඔහුට බලපැවැත්වීම අත්හිට විය යුතු ය. එසේ වුව ද, එවැනි ප්‍රදානයක් ඔහුට ගෙවනු ලැබිය යුත්තේ, පලාත් රාජ්‍ය සේවයේ, ඔහුගේ සේවා නියුක්තිය අවසාන වීමෙන් පසුව පමණි.

පලාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පලාත් පාලන සේවයේ සාමාජිකයකු පිළිබඳ විනය පාලනය සහ පත් කිරීම, ඔහුගේ ස්ථාන මාරු, විශ්‍රාම ගැනීම ආදිය පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු බව.

3. පලාත් රාජ්‍ය සේවයට පත්කරනු ලැබූ, පලාත් පාලන සේවයේ යම් සාමාජිකයකු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් මුදා හැරීම, විශ්‍රාම ගැන්වීම, ඔහුගේ තනතුර අහෝසි කිරීම, ඔහු ධුරයෙන් අස් කිරීම සහ ඔහු පිළිබඳ විනය පාලනය බස්නාහිර පලාතේ ආණ්ඩුකාරවරයා විසින් හෝ පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධන සහිත කියවිය යුතු 1987 අංක 42 දරණ පලාත් සභා පනතේ 32 වගන්තිය අනුව කරනු ලැබිය යුතු ය.

පලාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ සේවය පලාත් පාලන ආයතන වලට ලබාදිය හැකි බව.

4. පලාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ නිලධාරියකු ගේ සේවය, පලාත තුළ පිහිටි යම් පලාත් පාලන ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක, පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ නියෝජිතයෙකු විසින්, සුදුසු යයි සලකනු ලබන කාල පරිච්ඡේදයකට එවැනි පලාත් පාලන ආයතනයකට ලබාදිය හැකිය, යන්න එසේ පලාත් රාජ්‍ය සේවයට පත් කරනු ලබන සෑම නිලධරයෙකු සම්බන්ධයෙන් වූ නියමයක් සහ කොන්දේසියක් විය යුතු ය.

අර්ථ නිරූපනය

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි, "පලාත් සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පලාතේ පලාත් සභාව අදහස් වේ.

"පලාත් රාජ්‍ය සේවය" යන්නෙන් බස්නාහිර පලාත් සභාවේ පලාත් රාජ්‍ය සේවය අදහස් වේ.

VI

"පළාත් පාලන ආයතනය" යන්නෙන් බස්නාහිර පළාතේ පිහිටුවන ලද යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.

"පළාත් පාලන සේවය" යන්නෙන්, 1974 අංක 16 දරණ පළාත් පාලන සේවා පණත යටතේ පවත්නා සේවය අදහස් වේ.

"පළාත් පාලන සේවයේ සාමාජිකයා" යන්නෙන්, 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල, 39 වන නියෝගයේ "සාමාජිකයා" යන්නට දී ඇති අර්ථයම අදහස් වේ.

"පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයා" යන්නෙන්, බස්නාහිර පළාත් සභාව යටතේ පත්වීම් ලැබ ඇති සාමාජිකයකු අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"පළාත් පාලන සේවා කොමිෂන් සභාව" . න්නෙන්, 1985 අංක 10 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පණත මගින් සංශෝධිත, 1974 අංක 16 දරණ පළාත් පාලන සේවා පනතේ 3(1) හා 4(1) වගන්තිය ප්‍රකාර සංස්ථාපිත කළ පළාත් පාලන සේවා කොමිෂන් සභාව අදහස් වේ.

"පළාත් රාජ්‍ය සේවා කොමිෂම" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් වේ.